

# ශ්‍රී ලංකාවේ ලාවුළු වර්ග

තොරතුරු එක් කරන්නේ,
ටී. පී. ජී. අරුණ යසපාලිත, විෂයභාර නිලධාරී
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව

ශ්‍රී ලංකාවේ රට ලාවුළු, කොස් ඇට ලාවුළු, කිරි ලාවුළු, කොහොල්ල ලාවුළු, කෝලිකුට්‍යා හා සැපදිල්ලා ආදී වශයෙන් ලාවුළු ආකාර කිහිපයක් දැකිය හැකිය. කොහොල්ල ලාවුළු හැර මෙම සියල්ලම ලංකාවට විදේශ රටවලින් හඳුන්වාදී ඇත. මේවා සියල්ලම Sapotaceae කුලයට අයත් ඒවාය. රට ලාවුළු හා සැපතිල්ලා පලතුරු ලෙස අද ද ගෘහස්තව සිටුවන අතර අනෙක් ආකාර ගැන අවධානයක් යොමු වී නැත. කොස් ඇට ලාවුළු සමහර තැනක ස්වභාවීකරණයකට ලක්වී ඇති අතර කොහොල්ල ලාවුළු ස්වභාවිකව ද දැකිය හැකිය.

# කිරිපළු හෙවත් කොස් ඇට ලාවුළු





*Crysophyllum oliviforme*/ *Chrysophyllum monopyrenum* යන විද්‍යාත්මක නාමයන්ගෙන් හඳුන්වනු ලබන මෙම ශාක කොස් ඇට ලාවුළු ලෙස ද සමහරුන් කිරිපළු ලෙස ද හඳුන්වයි. (ආයුර්වේදයේදී කිරිපළු ලෙස භාවිතා වන්නේ Anacardiaceae කුලයට අයත් *Buchanaria axillaris* යන නාමයෙන් හඳුන්වන ශාකයයි. එම ශාකය සමඟ මෙය පටලවා නොගත යුතුයි. මෙහිදී සඳහන් වන්නේ පලතුරක් ලෙස භාවිතා වන කිරිපළු ශාකය පිළිබඳවයි. ඉංග්‍රීසි භාෂාවෙන් Satinleaf tree/ Date plum ලෙසද දෙමළ භාෂාවෙන් *Seemai palapallam* ලෙස ද හඳුන්වයි. නිවර්තන ඇමරිකාවට දේශීය වන මෙම ශාකය 1814 වර්ෂයේදී ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත. විශේෂයක් වුවත් සමහරක් ප්‍රදේශවල සතුන්ගෙන් සිදුවන ව්‍යාප්තිය හේතුවෙන් ස්වභාවිකරණයට ලක්වෙමින් පවතින බව දැකිය හැකිය. මෙම ශාකය තරමක් තෙත් සහිත උෂ්ණත්වයෙන් වැඩි ප්‍රදේශවල හොඳින් වැඩේ. ගසක් මීටර් 6 - 10 පමණ උසට වැඩේ. කඳෙහි පොත්ත අළු දුඹුරු පැහැයක් ගන්නා පැලුම් සහිත තරමක් රළු ස්වභාවයක් ගනී. පත්‍ර දිගින් සෙන්ටිමීටර් 3 - 11 හා පළලින් සෙන්ටිමීටර් 2 - 5 වන ඉලිප්සාකාර හැඩයකින් යුත් ඒවාය. පත්‍රය යටි පැත්ත දිලිසෙන සුළු තඹ පැහැයක් දරයි. (Crysopyllum යනු රන්වන් පැහැති පත්‍ර යන්නයි.) උඩු පැත්ත කොළ පැහැතිය. පත්‍ර අතුවලට ඒකාන්තරව සවිවීම සිදුවේ. මල් කිහිපය බැගින් පත්‍ර කක්ෂ වලින් අතු දිගටම ඇති වේ. මෙම මල් ලා කහ පැහැයට හුරු සුදුපැහැතිය. ඉලිප්සාකාර - අණ්ඩාකාර හැඩයට මදක් හුරු, සෙන්ටිමීටර් 2 - 2.5 පමණ දිග සෙන්ටිමීටර් 1 ක් පමණ පළල කුඩා ඵලයන් ඇති වන අතර මේවා ලපටි කාලයේ කොළ පාටටත් ඉදෙන විට දම් පැහැ වී අවසානයේ දම් - කළු පැහැයටත් හැරේ. ගෙඩියෙහි මුදුනෙහි මලෙහි කුඩා මණිපත්‍ර ඉතිරිව පවතී. ඵලයක් තුළ දුඹුරු පැහැති තනි බීජය බැගින් පවතින අතර ව්‍යාප්තිය බීජ මඟින් සිදුවේ.

ගඩා ගෙඩි ලෙස අතීතයේ කිරිපළු ගෙඩි භාවිතාකර ඇත. ඉදුණු ඵලවලට පැණිරසක් ඇති අතර පළු රසයට තරමත්

සමානය. අමු ගෙඩි වුයින්ගම් පරිද්දෙන් දිගු වේලාවක් සැපිය හැකිය. ගෙඩිවල ඇලෙන සුළු කිරි අඩංගු නිසාත් පළු රසයට සමාන නිසාත් මෙයට කිරිපළු යන නම භාවිත කළා විය හැකිය.

## කිරිපළු හෙවත් කිරිලාවුළු





*Crysophyllum cainito* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබයි. ඉංග්‍රීසි භාෂාවෙන් Star apple/ Caimito යන නම භාවිතා කරයි. Star apple යන නම ලැබී ඇත්තේ ඵලයේ හරස් බීජ තරුවක ආකාරයට පිහිටා ඇති බැවිනි. ශ්‍රී ලංකාවට 1802 වසරේදී හඳුන්වා දුන් විශේෂයක් වන මෙය තෙත් කලාපයේ දැකිය හැකිය. පත්‍ර හැඩයෙන් ඉලිප්සාකාර වන අතර එහි යටි පැත්ත තඹ පැහැතිය. පත්‍ර ඒකාන්තරව අතුවල සකස් වේ.

ලා කහ පැහැයට හුරු මල් කාක්ෂිකව ඇතිවේ. මෙහි ඵලයන් ගෝලාකාරවන අතර ප්‍රමාණයෙන් තරමක් විශාලය. සාමාන්‍යයෙන් ඵලයක් අඟල් 1.5 - 2.5 විතර විෂ්කම්භයක් දරයි. කොළ පැහැති හා දම් පැහැති ලෙස ප්‍රභේද දෙකක් පවතී. මෙම ඵලයන් කිරිපළු වලටත් වඩා කිරි සහිතය. ඵලයක් තුළ බීජ කිහිපයක් පවතින අතර ව්‍යාප්තිය බීජ මඟින් සිදුවේ. ඉදුණු ගෙඩි රසවත් පලතුරක් ලෙස භාවිතා කරන අතර ප්‍රණීත පැණි රසක් ඇත. මෙම පලතුරු ගස් දෙකම අලංකාර ශාකයන් බැවින් උද්‍යාන අලංකරණයේදීද යොදා ගත හැකිය.

## කොහොල්ල ලාවුළු

*Crysophyllum roxburghii* යන නාමයෙන් හඳුන්වයි. ශ්‍රී ලංකාවේ තෙත් වනාන්තර වල ස්වභාවිකව දැකිය හැකි ආකාරයකි. මෙහි පත්‍ර ලන්සාකාර හැඩයක් ගනී. එහි පත්‍ර යට පැත්ත රන්වන් පැහැයක් නොගනී. ඵලයන් සෙන්ටිමීටර් 2.5 - 4 විතර විෂ්කම්භයක් ගන්නා අතර ලා කොළ පැහැතිය. ගෙඩියේ පිටතින් මද වශයෙන් පැති හතරක් හෝ පහක් දැකිය හැක. ඵලය තුළ කිරි ලාවුළු ආකාරයටම බීජ පිහිටා ඇත. ලා දුඹුරු පැහැයක් ගන්නා මෙම බීජ, ශාක ප්‍රචාරණයට උපකාරිවේ.





ඉදුණු ඵල ආහාරයට ගන්නා අතර අඩංගු කිරි ප්‍රමාණය ඉතා වැඩිය. ආහාරයට ගැනීමට පෙර නටුව ලඟ තුවාල කර ඉරටුවක් කරකවමින් කිරි ඉවත් කරන හෙයින් කොහොල්ල ලාවුළු යන නම ලැබෙන්නට ඇත. මෙය කිරිලාවුළු මෙන් ප්‍රණීත නොවේ.

## රට ලාවුළු





*Pouteria campechiana* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හා Yellow sapote යන ඉංග්‍රීසි නාමයෙන් ද හඳුන්වනු ලබයි. මධ්‍යම ප්‍රමාණයේ ගසකි. මෙහි පත්‍ර ප්‍රමාණයෙන් හා හැඩයෙන් අඹ පත්‍ර වලට තරමක් සමානයි. ඵලය ඇපල් ගෙඩි හැඩයක් හෝ අග කෙලවර උල්වූ අණ්ඩාකාර හැඩයක් ගනී.

ලපටි කාලයේදී කොළ පැහැයකුත් මෝරණ විට කහ පැහැයකුත් ඉදුණු පසු කහ - තැඹිලි වර්ණයකුත් ගනී. ඵලයක් තුළ දිලිසෙන ගතියෙන් යුත් දුඹුරු පැහැති දෙකෙලවර

උල්වූ බීජ එකක් හෝ කිහිපයක් ඇත. ව්‍යාප්තිය බීජ මගින් සිදුවන අතර ලේයර් කිරීම හා බද්ද පැළ මගින්ද සිදුකළ හැක. පලතුරක් ලෙස ඉදුණු ඵල භාවිතා කළ හැකි අතර එයට ආවේණික රසක් සමග පැණි රසක් ඇත. පිටි ගතියෙන් ඉතා වැඩිය. සමහරු පැසුණු ගෙඩි නෙලා, ඇස්ස ලඟ ලුණු කැටයක් තබන අතර මේනිසා ඉක්මනින් ඵලය ඉදීම සිදුවේ. පැසුණු ගෙඩි සිහින්ව ලියා රසවත් ආහාරයක් ලෙස සකසා ගත හැකිය.

## සැපතිල්ලා





*Manilkara sapota* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන මෙය කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ ගසකි. පත්‍රවල හැඩය හා පිහිටීම තරමක් මී ගසකට සමානය. එහෙයින් සමහරු මෙම ගස රට මී ලෙසද හඳුන්වයි.

ඵලය දුඹුරු පැහැති තරමක් රළු පොත්තකින් යුක්තයි. ඉදුණු පසුවද පැහැය එතරම් වෙනස් නොවේ. ඵලය තුළ තද දුඹුරු පැහැති දෙකෙලවර උල් බීජ එකක් හෝ කිහි-පයක් පවතී. ව්‍යාප්තිය බීජ මගින් සිදුවන අතර බද්ද පැළ මගින්ද සිදුකළ හැකිය. මෙහි අංකුර මී ගසටද බද්ධ කළ හැකි බව පැවසේ. ඉදුණු ඵලයන්ට තද පැණි රසක් සමග ආවේණික රසයක් ඇත.


## කෝලිකුටියා

මෙය *Pouteria multiflora* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබයි. ඉංග්‍රීසි භාෂාවෙන් Bully tree ලෙසට හඳුන්වයි. ශ්‍රී ලංකාවට කැරිබියන් දූපත්වලින් හඳුන්වා දී ඇති අතර ශ්‍රී ලංකාවේ නුවර, මාතලේ වැනි තරමක් කඳු සහිත තෙත් ගතියෙන් යුත් ප්‍රදේශවල ගෘහස්තව සිටුවාගෙන සිටිනු දැකිය හැකිය. ගස තරමක් සැලැස්මෙන් වෙරළු ගසක් වැනිය. මධ්‍යම ප්‍රමාණයේ ගසක් වන මෙහි පොත්ත අළු දුඹුරු පැහැයක් ගන්නා මදක් රළු ගතියකින් යුක්ත වූවකි. පත්‍ර ඉලිප්සාකාර - ප්‍රතිඅණ්ඩාකාර හැඩයක් ගනී.





අතු අගට වන්නට පත්‍ර කක්ෂ අතරින් කුඩා මල් ඇතිවන අතර මේවා පිපුණු පසු සුදු පැහැයට හුරුය. ඵලය වෙරළු ගෙඩියක ප්‍රමාණයට හෝ ඊට මදක් විශාලවන අතර හැඩයෙන් ප්‍රත්‍යණ්ඩාකාරය. නටුවට සම්බන්ධවන තැන ඇස්සක් ඇත. ගෙඩියේ යටි කෙළවර කලංකය ඉතිරිව පවතී. අමු ගෙඩි කොළ පැහැයක් ගන්නා අතර ඉදුනු පසු කහ - තැඹිලි වර්ණයක් ගනී. ඵලයක් තුළ දුඹුරු පැහැති තනි තරමක් ලොකු බීජයක් පවතින අතර ව්‍යාප්තිය බීජ මඟිනි. මෙම ශාකයේ ද ලාවුළු කුලයේ අනෙක් ශාකවල මෙන් කිරි අඩංගුය. පලතුරක් ලෙස ඉදුණු ඵල ආහාරයට ගත හැකි අතර ඒවාට ආවේණික පැණි රසක් ඇත.



# ගොවිකමේ

## සැබෑ උරුමක්කාරයන් වෙත . . .

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සියක් වසක් සපුරා ඇතත් ගොවිකමේ අතීතය කෙදිනක සිදුවුනිදැයි නොදනිමු. ගොවිකම් සඟරාවටත් වසර 107 ක ඉතිහාසයක් තිබේ.

කාලය සමඟ වෙනස්වීම සොබාදහමයි. යුගයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි වෙනස්වීම් සිදුවිය යුතුමය.

ඒ අනුව ගොවිකමේ සැබෑ උරුමක්කාරයන් වන බාල තරුණ වැඩිහිටි, ගොවිතැනේ නියැලෙන හා ගොවිකම ගැන උනන්දු වන ඔබේ අදහස් යෝජනා චෝදනා සියල්ලටම ගොවිකම් සඟරාව විවෘත වේදිකාවක් කරගනිමු . . .

***හැමෝටම දැනගන්න ගොවිතැන හා ගොවිකම පිළිබඳ ඔබේ හෝ ඔබ පළාතේ තොරතුරු අපට කියන්න. ලියන්න. ඔබ හමුවී කතා කරන්නටත් අප කැමතියි . . . .***


**අපේ ලිපිනය :**
සංස්කාරක,
ගොවිකම් සඟරාව,
කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය,
තැ.පෙ. අංක 24,
ගන්නොරුව,
පේරාදෙණිය.

**දුරකථන අංක :**
මිලින්ද - 077 6133877
ජනක - 071 8060793

e mail : govikamsangarawa@gmail.com